0271

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර අධ්‍යයන පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතිය II – LLU4708

අඛණ්ඩ ඇගයුම් පරීක්ෂණය II – 2023/24

කාලය - පැය 01යි.

| දිනය - 04-12-2023 | වේලාව - පෙව 11.30-ප.ව. 12.30 |
|---|---|

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

මුළු ප්‍රශ්න ගණන - 02 කි.

එක් (01) ප්‍රශ්නයක් සඳහා පමණක් පිළිතුරු සපයන්න.

1. ජුම්භාගයා රාජ්‍යය පසුගිය කාලයේ ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ පෑ රටකි. පොදුජනතාවගේ ගැටලු විසඳීමට අසමත් වීම නිසා, ආණ්ඩුවට අප්‍රසාදය පල කිරීම සඳහා වූ උද්ඝෝෂණ රට පුරා පැවැත්විණි. 2023 නොවැම්බර් වන දා, ජුම්භාගයා රාජ්‍යයේ ජනාධිපතිවරයා හදිසි නීති තත්වයක් ප්‍රකාශයට පත් කලේය. නිතර පැවැත්වෙන උද්ඝෝෂණ නිසා මහජන සාමය හා ආරක්ෂාවට තර්ජනයක් ඇති වන බැවින් තමුන් මෙම පියවර ගත් බව ඔහු පැවසීය.

   හදිසි නීති රෙගුලාසි මාලාවේ උපුටා ගත් කොටසක් පහත පරිදිය:

   > *[...] 2.1. කිසිදු පුද්ගලයෙකුට විරෝධතා උද්ඝෝෂණයක් සංවිධානය, මෙහෙයවීම හෝ ඒ සඳහා සහභාගී වීමට අවසර නොමැත.*
   >
   > *2.2 රජයේ ආර්ථික ප්‍රතිපත්තිය ප්‍රසිද්ධියේ විවේචනය කිරීමට කිසිදු පුද්ගලයෙකුට අවසර නොමැත. එබඳු ප්‍රකාශයක් නීති විරෝධී ලෙස සැලකෙන අතර හදිසි නීති රෙගුලාසි උල්ලංඝණය කිරීමක් වේ.*
   >
   > *2.3 ඉහත දැක්වෙන වරදවල් සිදුකරන, ඒ සඳහා ආධාර හා අනුබල දුන් බවට සැක කෙරෙන පුද්ගලයන් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ වෙන් වූ ස්ථානවල රැඳවිය යුත්තේය. රැඳවුම් කාලය මාස දොලහක උපරිමයකට යටත්ව ඇමතිවරයා විසින් නියම කරනු ලැබිය හැක.*

   හදිසි තත්වය ප්‍රකාශයට පත් කිරීම නොතකා, රට පුරා විරෝධතා ව්‍යාපාර ඇති විය. අවසන් වසර විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක් වූ ඩයස්, නොවැම්බර් 29 දා පැවැති උද්ඝෝෂණයකට සහභාගි වූයේය. මෙය මූලික වශයෙන් සාමකාමී විරෝධතාවයකි. කෙසේ වුවද, පිරිස විසුරුවා හල පොලිසිය, ඩයස් ඇතුලු තවත් උද්ඝෝෂකයන් පිරිසක් අත්අඩංගුවට ගත්හ. පොලිස් රැඳවුම්භාරයේ සිටිය දී ඔහු දැඩි ලෙස පහර කෑමට ලක්විය. පසුව, හදිසි නීති රෙගුලාසි යටතේ සති තුනක කාලයක් ඔහුව රඳවා තබන ලදී.

   තමුන්ට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කල හැක්කේ කවර පදනම් මතදැ'යි ඩයස් ඔබගෙන් උපදෙස් පතයි. ජුම්භාගයා හි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට සමාන බවට උපකල්පනය කරන්න. (ලකුණු 20)

*2. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හෝ නීතිය මගින් තහවුරු කොට තිබෙන මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වන අවස්ථාවක නිසි බලය සහිත ජාතික අධිකරණයක් මාර්ගයෙන් ලැබෙන ප්‍රතිඵලදායක ප්‍රතිකර්මයක් සඳහා සෑම කෙනෙක්ටම අයිතිවාසිකමක් ඇත*

*- මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය, 8 වන වගන්තිය*

ශ්‍රී ලංකාව තුල මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමක දී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිකර්ම වෙනුවෙන් පවතින අයිතිවාසිකමෙහි තත්වය පිළිබඳ විවේචනාත්මකව විමසන්න. ඔබගේ පිළිතුර අදාල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන හා නඩු තීරණ ආශ්‍රයෙන් සනාථ කල යුතුය.

(ලකුණු 20)

***